BKT 0080
25.08.2023

## "මිහිලිය හරිත සළුවෙන් සරසාලමු"

# ''වනරෝපා''

## ජාතික රුක් රෝපණ වැඩසටහන



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

**"මිහිතලයේ අභිරමණීය සෞන්දර්යය වර්ණවත් කරනු ලබන තුරු සම්පත අද දවසේ මිහිමත ජීවයේ පැවැත්ම තීන්දු කරන තීරක බලවේගය ලෙසින් ලොව ප්‍රමුඛතම අවධානය දිනා සිටියි. තිරසර සංවර්ධනයේ මූලික සාධකය බවට පත්වන්නේ ද හරිත පැහැයෙන් වර්ණිත තුරුලිය උරුමයයි"**

2017 ඔක්තෝබර් 11වන දින දෙල්තොට, කන්දෙතැන්න වැව් පරිශ්‍රයේ පැවති ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සහ වන රෝපා ජාතික රුක් රෝපණ වැඩසටහන වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා සිදුකල ප්‍රකාශයෙන් උපුටා ගත්තකි.

# ''පුනරුදය''

පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය
ජනාධිපති කාර්යාලය,
කොළඹ - 01.



# 1956 දී ශ්‍රී ලංකාවේ වන වැස්ම




# 2010 වන විට ශ්‍රී ලංකාවේ වන වැස්ම




**1900 වසර වන විට 80% ක්ව පැවති ශ්‍රී ලංකාවේ ස්වාභාවික වනාන්තර ප්‍රමාණය 1956 වන විට 44% වූ අතර 2010 වන විට 29.7% ක් බවට පත්වී ඇත. මෙලෙස වන වැස්ම දිනෙන් දින අවම වීම වර්තමානයේ උග්‍ර පාරිසරික ගැටළුවකි.**

මේ හේතුවෙන්,

- ජෛව විවිධත්වය විනාශ වීම.
- සතුන්ගේ වාසස්ථාන අහිමි වීම.
- ජල පෝෂක ප්‍රදේශ විනාශ වීම.
- පාංශු ඛාදනය ඉහල යාම.
- දේශගුණික විපර්යාස ඇති වීම.
- ජල හිඟය හා ජල දූෂණය.

යනාදී පරිසර ගැටළුවලට අපට මුහුණ පෑමට සිදුව ඇත.

එම ගැටළු අවම කරගනු වස්,

ජෛව විවිධත්වය, පස, ජලය, වායු ගෝලය රැක ගනිමින් වනාන්තර සංරක්ෂණය කිරීම, තුරු ආවරණය හා වනාන්තරවල ඵලදායිතාවය වැඩි කිරීම මගින් ඉහළ ගුණාත්මකතාවයකින් යුතු වන ගහනයක් ශ්‍රී ලංකාව තුල ස්ථාපිත කිරීම "වනරෝපා" වැඩසටහනෙහි ප්‍රමුඛ අරමුණ වේ.

ඒ යටතේ පහත ප්‍රධාන පියවරයන් අනුගමනය කෙරේ.

- නව වන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පරිහානියට පත් වනාන්තර පුනරුත්ථාපනය කිරීම
- කෘෂිකාර්මික ව්‍යාපෘති, සංවර්ධන හා යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා වන ඉඩම් භාවිතය අවම කිරීම හා අනවසරයෙන් අල්ලා ගැනීම වැළැක්වීම
- ගවයන්ගෙන්, ආක්‍රමණකාරී ජීවීන්ගෙන් සහ ඛනිජ ඉවත් කිරීමෙන් සිදුවන හානිය අවම කිරීම
- අනවසර දැව හෙළීම් පාලනය
- භූමි පරිහරණ සැළසුම් පදනම් කරගනිමින් නිවාස අවශ්‍යතා සඳහා භූමිය නිසිලෙස වෙන්කර ගැනීම සහ අනවසර පදිංචිකරුවන් නීති මගින් ඉවත් කිරීම
- පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
- ජල මූලාශ්‍ර ජල පෝෂක ප්‍රදේශ හා ජල රක්ෂිත ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම
- ආක්‍රමණකාරී ශාකවල ව්‍යාප්තිය පාලනය
- දැව නොවන වනජ ද්‍රව්‍ය පාලනයකින් තොරව ඉවත් කිරීම නතර කිරීම

## සුරක්ෂිත අනාගතයක් උදෙසා වන ගහණය වැඩි කිරීමට ඔබත් දායක වන්න.

ඔබගේ ජීවිතයේ වැදගත් අවස්ථා වලදී පැළයක් සිටුවා වන රෝපණයට දායක වන්න.

- දරුවකු උපදින අවස්ථාව සිහිවීමට පැළයක් සිටුවන්න. දරුවා මෙන් ම ඔහුගේ සහෝදරයෙකු බඳු පැළයද හොඳින් රැකගන්න දරුවාට හුරු කරන්න.
- වසරක් පාසා එළඹෙන සෑම උපන් දිනයකදී ම පැළයක් සිටුවා රැකබලා ගන්න.
- ඔබගේ ආගම ජාතිය කුමක් වුව ද තම ජාතියෙහි හෝ ආගමෙහි සංස්කෘතික වටිනාකමක් ඇති දිනයක පැළයක් රෝපණය කර ගෞරවයෙන් යුතුව එයට සත්කාර කරන්න.
- ඔබගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ගසක් කපන සෑම අවස්ථාවකදී ම එම ගස වෙනුවට තවත් පැළ 2ක් වත් සිටුවන්න.
- ඔබ නව නිවසක පදිංචිවන සෑම අවස්ථාවකදී ම ඔබට සෙවණ ලබා දෙන පැළයක් සිටුවන්න.
- ඔබේ දිවියේ සුවිශේෂී අවස්ථා සිහිපත් කිරීමට පැළයක් සිටුවන්න.

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023
පුස්තකාලය

" පැළයක් සිටුවා රටක් සුරකිමු "

පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
ජනාධිපති කාර්යාලය, කොළඹ - 01.
දුරකථන : 0112 354 354 දිගුව (3945,3841,3586)
විද්‍යුත් තැපැල : env@presidentsoffice.lk